**පැලියගොඩ මධ්‍යම මත්ස්‍යා වෙළෙඳ සංකීර්ණ කළමනාකරණ භාරය - 2016**

---

පැලියගොඩ මධ්‍යම මත්ස්‍යා වෙළෙඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 කළමනාකරණ භාරය පිහිටුවීම

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2010 මැයි 14 දින ඉදිරිපත් කරන ලද පැලියගොඩ මධ්‍යම මත්ස්‍යා වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය පිහිටුවීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 ජුනි 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එකී තීරණය ප්‍රකාරව කළමනාකරණ භාරය පිහිටුවා තිබුණ ද, 2016 දෙසැම්බර් 31 දක්වාම ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 1.5 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතයේ 18 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් වර්ගීකරණය කර වාර්තා කළ යුතු බව දක්වා ඇතත් 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය එපරිදි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයක මුළු පිරිවැය හා සසඳන විට එම අයිතමයේ කොටස් වෙන් වෙන්ව ගෙන ක්ෂය කළයුතු බව දක්වා ඇතත් පිරිවැය රු.38,598,438 ක් වූ අපද්‍රව්‍ය පිරිපහදු යන්ත්‍රාගාරයේ හා අයිස් නිෂ්පාදනාගාරයේ යන්ත්‍ර හා ගොඩනැගිලි, යන්ත්‍ර හා ගොඩනැගිලි වශයෙන් වෙන්ව හඳුනා ගැනීමකින් තොරව යන්ත්‍රෝපකරණ වශයෙන් සලකා සමස්ත පිරිවැය සඳහා සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. තවද, යන්ත්‍ර හා ගොඩනැගිලි වෙන්ව හඳුනා නොගෙන සමස්ත අයිස් යන්ත්‍රාගාරයම ගොඩනැගිලි සේ සලකා සියයට 3 බැගින් ක්ෂය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාරයේ ක්ෂය ප්‍රතිපත්ති අනුව නියමිත ක්ෂය අනුපාතයන්ට වෙන්කිරීම් සිදුකළ යුතු වුවත්, පරිගණක උපාංග හා Treatment Plant යන වත්කම් ඊට අඩුවෙන් ක්ෂය වෙන්කිරීම සිදු කිරීම හේතුවෙන් එකතුව රු.64,658 කින් ක්ෂය ප්‍රතිපාදන වියදම අඩුවෙන් හා සමාන ප්‍රමාණයකින් වත්කම් අගය වැඩියෙන් ද ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ලංකා ධීවර සංස්ථාව විසින් පරිහරණය කරනු ලබන භාරයට අයත් අයිස් යන්ත්‍රාගාරය හා වෙළඳසැල් 2 ක් වෙනුවෙන් 2016 වර්ෂයට අදාලව ලැබිය යුතු බදු කුලී ආදායම රු.8,460,000 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ හඳුනානොගත් වෙනස ලෙස රු.163,797 ක ශේෂයක් ගලපා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ දී අයිස් නිෂ්පාදනාගාරයේ සිදුකළ රු.2,656,080 ක් වූ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනීත කිරීමට කටයුතු නොකර 2015 වර්ෂයේ දී අයභාර වියදම් යටතේ ගිණුම්ගත කර තිබීම සමාලෝචිත වර්ෂයේ දී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව මුදල් ශේෂය රු.27,987,097ක් වුවද එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ශේෂය රු.28,005,997 ක් වශයෙන් දක්වා තිබීම නිසා රු.18,900 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

-----------------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු. 5,182,315 ක් වූ ණයහිමියෝ හා අනෙකුත් වගකීම් ඊට අදාල උපලේඛනය අනුව රු. 5,042,455 ක් ලෙස දක්වා තිබීමෙන් රු.139,860 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයන් හි ණයගැතියෝ හා අනෙකුත් ලැබීම් යටතේ දක්වා ඇති රු.190,737 ක් වූ ජලනල තොගය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා තොග ලෙජරය අනුව සනාථ නොවූ අතර භෞතික පරීක්ෂාවේ දී ද එවැනි තොගයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථවාහන අංගනයේ ආදායම් එකතු කිරීමේ කටයුතු පෞද්ගලික සමාගමකට පවරා එම සමාගම සමඟ එළඹුණු ගිවිසුම අනුව මාසිකව ශුද්ධ ආදායමෙන් සියයට 40 ක් භාරයට අයවිය යුතු බව දක්වා ඇත. 2016 වර්ෂයේ භාරයට ලැබිය යුතු ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.5,499,439 ක ආදායම තහවුරු කර ගැනීම සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන හෝ වෙනත් සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වගන්තිය | 2015 වර්ෂයේ රු. මිලියන 95 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 91 ක බදුකුලී ආදායමක් උපයා ඇති භාරය එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 හා 757 සහ 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2017 මාර්තු 22 දින ඉදිරිපත් කළ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් නිරීක්ෂණය වූ අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර වාර්තා කර නොතිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක පීඊඩී 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාරයේ සභාපති, භාර මණ්ඩලය සඳහා භාණ්ඩාගාරය පත්කළ නියෝජිත, පරිපාලන සම්බන්ධීකාරක යන අයට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ මාසික දීමනා වශයෙන් රු. 62,500 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,728,485 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.31,466,989 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 18,738,504 ක වර්ධනයක් ඇති වී තිබුණි. වෙළඳසැල් පැවරීමේ ආදායම රු.5,500,000 කින් වැඩි වී ආරක්ෂක වියදම රු.6,047,817 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ රු.863,735 ක් වූ ඌනතාවය 2016 වර්ෂය දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේ දී 2012 වර්ෂයේ දී රු.63,908,465 ක් වූ දායකත්වය 2016 වර්ෂයේ දී රු.60,440,002ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

කළමනාකරණ භාරය ස්ථාපිත කිරීමට අදාළ 2010 ජුනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කළමනාකරණ භාරයේ පරමාර්ථ සහ කාර්යභාරය වූයේ,

- පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පූර්ණ පාලනය සහ කළමනාකරණය භාර ගැනීම, එකී සංකීර්ණය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම සහ ඊට සම්බන්ධ හෝ ආනුශාංගික කාරණා ගැන කටයුතු කිරීම.

- ඉහත ඡේදයේ සඳහන් පරමාර්ථ සහ කාර්යය ඉටුකර ගැනීම සඳහා සීමා කිරීමකින් තොරව සියලුම ක්‍රියාමාර්ග ගැනීම, වෙනත් සියලු පියවර ගැනීම සහ වෙනත් සියලු කටයුතු කිරීමට භාර ගැනීම වේ.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වෙළෙඳ සංකීර්ණයේ පූර්ණ පාලනය හා එම සංකීර්ණය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම කළමනාකරණ භාරයේ වගකීමක් වුවද, භාරය සතු කඩ කාමරයක් බදුදීම තුළින් උපයන ආදායම, කැට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් බදුදීම වෙනුවෙන් ලැබුණු ආදායම හා පරිශ්‍ර භූමියේ අයිස් අලෙවිය වෙළෙඳ සංගමයට පැවරීම තුළින් උපයන ආදායම ලංකා ධීවර සංස්ථාව විසින් ලබාගන්නා බව භාරයේ සභාපති විසින් දන්වා තිබුණි. එම නිසා ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී භාරයට ලැබිය යුතු ආදායම රු.4,272,000 ක් භාරයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාරය පිහිටුවීමේ දී භාරකරුවන් 15 දෙනෙකු විසින් භාරය කළමනාකරණය කලයුතු බවට දැක්වෙන අමාත්‍ය මණ්ඩල සංදේශය නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත්කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. කෙසේ වුවද භාරයේ සාමාජිකයෙකු වන සෞඛ්‍ය අමාත්‍යාංශ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා 2011 සැප්තැම්බර් 30 දින සිට භාර රැස්වීම් සඳහා සහභාගී වී නොතිබුණු අතර ඒ වෙනුවට වෙනත් සාමාජිකයෙකු පත්කර ගැනීමට භාරය කටයුතු කර නොතිබුණි.

(ආ) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථ වාහන අංගනයේ ආදායම් එකතු කිරීමේ කටයුතු ලංකා ධීවර සංස්ථාව විසින් පවරා ගෙන තිබුණු අතර සංස්ථාව එම කාර්යය පෞද්ගලික සමාගමකට පවරා 2011 මාර්තු 07 දින සිට වසර 10 ක් සඳහා එම සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව එම ආදායමෙන් සියයට 40 ක් ධීවර සංස්ථාවට හිමි විය යුතු විය. කෙසේ වුවද 2016 මැයි 17 දින පැවති කළමනාකරණ භාර රැස්වීමේ දී රථ වාහන අංගනයෙන් භාරයට ලැබිය යුතු ආදායම ශුද්ධ ආදායමෙන් සියයට 50 ක් විය යුතු බවට ගිවිසුම සංශෝධනය කළයුතු බව දක්වා ඇතත් 2017 අගෝස්තු වන විටත් එම තීරණය අනුව ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකිර්ණයේ පිහිටුවා තිබූ පතුරු අයිස් නිෂ්පාදනාගාරය රු.3,900,000 ක වාර්ෂික බදු මුදලකට ලංකා ධීවර සංස්ථාවට ලබාදී තිබූ අතර, ඒ වෙනුවෙන් සංස්ථාව සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද එම ආදායම අයකර ගැනීමට ද භාරය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ ව්‍යාපාරිකයින්ගේ අයිස් අවශ්‍යතාවය ඉටුකර ගැනීම මත්ස්‍ය වෙළඳ සංගමයට පැවරීමට 2015 ජුලි 17 දින භාර මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මත්ස්‍ය වෙළඳ සංගමය වෙත එම කාර්යය පැවරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ලංසු කැඳවීමක් සිදු කර නොතිබුණු අතර ලිඛිත ගිවිසුමකට එළඹීමට ද කටයුතු කර නොතිබුණි.

(ii) 2015 අගෝස්තු 24 දින සිට මාස 3 ක කාලයක් සඳහා අයිස් සැපයීමේ කාර්ය වෙළෙඳ සංගමයට පවරා තිබුණ ද 2016 පෙබරවාරි 16 දින දක්වාම එම කාර්යය වෙළඳ සංගමය විසින් සිදුකර තිබුණි. එදින සිට අයිස් සැපයීමේ කාර්යය ලංකා ධීවර සංස්ථාව විසින් සිදුකරනු ලබන බවත් ඒ සඳහා කිසිදු මුදලක් භාරයට ලබා දී නොමැති බවත් භාරයේ සභාපති විසින් දන්වා තිබුණි. කෙසේ වුවද අයිස් සැපයීමේ කාර්යය ලංකා ධීවර සංස්ථාවට පැවරීම සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) භාර මණ්ඩලය විසින් 2015 ජුලි 17 දින තීරණය කර තිබූ පරිදි 2017 මාර්තු 01 දිනට පෙර කැට අයිස් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ කාර්යය අවසන් කළයුතු වුවද 2017 අගෝස්තු වන විටත් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iv) කැට අයිස් අලෙවි කිරීම සඳහා සැපයුම් කරුවන් තෝරා ගැනීමට වෙළඳ සංගමයට පවරා තිබූ නමුත් වෙළඳ සංගමය සමඟ හෝ කැට අයිස් අලෙවිය සඳහා තෝරා ගෙන තිබූ ව්‍යාපාරිකයන් සමඟ හෝ ගිවිසුම් වලට එළඹීමට භාරය කටයුතු කර නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේ ආරම්භ කරන ලද මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ ප්‍රධානම ආදායම් මාර්ගය, වත්කම් බදු දීම වන අතර, ඒ තුළින් ආදායම් උපරිම අයුරින් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව පහත කරුණු වලින් නිරීක්ෂණය විය.

(i) 2016 වර්ෂය හා පසුගිය වර්ෂ 4 ක වෙළඳසැල් බදු දීමේ ආදායම සමාලෝචනය කිරීමේ දී 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ කුලී ආදායම හා වර්ෂය තුළ උපයා ගන්නා ලද කුලී ආදායම පිළිවෙලින් රු.17,787,000 ක් හා රු.31,952,527 කින් අඩු වී තිබුණු අතර ලැබිය යුතු කුලී ආදායම රු.14,165,527 කින් වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ තොග වෙළඳ කුටියක වෙළඳපල බදු අගය රු.මිලියන 2.1 සිට 4.7 ක් දක්වා පරාසයක පවති. බදු ගිවිසුමේ 14 වගන්තිය අනුව බදු ගත් වෙළඳසැලක් හෝ කොටසක් උකස් කිරීමට, විකිණීමට හෝ වෙනත් ගණුදෙනුවක් සඳහා භුවමාරු කිරීමට කිසිදු අයිතියක් බදු ගැණුම්කරු වෙත නොමැති බව දක්වා තිබුණි. එහෙත් වෙළඳ ව්‍යාපාරිකයන්ට පවරා තිබූ වෙළෙඳසැල්වල බදු කාලය අවසානයේ දී භාරය වෙතට පවරාගෙන ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කරමින් නැවත බදු දීමට භාරය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් එවැනි වෙළෙඳසැල් 11 ක් පවත්වාගෙන ගිය කඩකුලී හිමියන්ට එම වෙළඳසැල් බාහිර පාර්ශවයන් වෙත පැවරීමට ඉඩ ලබා දී එක් වෙළෙඳ කුටියකින් රු.500,000 ක මුදලක් පමණක් භාරය විසින් ලබා ගෙන තිබුණි. එම බදු කාලය අවසන් වූ වෙළඳසැල් හිමියන්ගෙන් අයවිය යුතු රු.360,000 ක හිඟ කුලී ආදායම් අයකර ගැනීමට ද භාරය විසින් කටයුතු කර නොතිබුණි.

(ඊ) භාරය ආරම්භ කර වසර 5ක් ඉක්මවා තිබුණ ද පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය පිහිටි අක්කර 7 රූඩ් 3 පර්චස් 14.9 ක් වූ ඉඩම භාරය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණ අතර 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිකුත් කර ඇති විගණන විමසුම් 33 කට 2016 දෙසැම්බර් 31 දක්වාම පිළිතුරු සපයා නොතිබුණි.

(ඌ) මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය වෙත අයදුම් කර තිබුණ ද, එම අධිකාරියේ නිර්දේශ අනුව අප ජලය පිරිපහදු කර නිදහස් කිරීමට හා පිරිවිතර වලට අනුකූලව වෙළඳ සංකීර්ණ පරිශ්‍රය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණු බැවින්, 2016 දෙසැම්බර් වන විටත් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩමෙහි අයිතිය භාරය වෙත පවරාගෙන නොතිබිය දී කැට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 01 දින සිට වර්ෂ 10 ක කාලයකට භාරය විසින් තෙවන පාර්ශවයකට ඉඩමේ කොටසක් බදු දීම සම්බන්ධයෙන් බදු දීමනාකරු වශයෙන් ගිවිසුමකට බැදී තිබීම නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය විය .

(ආ) වෙළඳ සංකීර්ණයේ ඉවත දමන මත්ස්‍ය අපද්‍රව්‍ය යොදාගෙන සත්ව ආහාර හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර අලෙවි කිරීම සඳහා පෞද්ගලික සමාගමකට පවරා තිබුණු අතර ඒ සඳහා පරිශ්‍ර භූමියේ ගොඩනැගිලි ඉදිකර ගැනීමටත් එමඟින් මාසික කුලියක් අයකර ගැනීමටත්, 2014 අගෝස්තු 20 දින වසර 15 කට බල පැවැත්වෙන පරිදි ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද මත්ස්‍ය අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් භාරය විසින් සමාගම වෙත මුදල් ගෙවිය යුතු බව ගිවිසුමේ සඳහන් නොවුවද රු.6,101,216 ක මුදලක් භාරය විසින් සමාගම වෙත ගෙවීම මතභේදයට තුඩුදෙන කරුණකි.

(ඇ) භාරය සතුව තිබෙන ඉඩමක් හා කඩ කාමරයක් බාහිර පාර්ශවයන් වෙත බදුදීමෙන් හා අයිස් අලෙවිය වෙනුවෙන් භාරයට ලැබිය යුතු එකතුව රු.4,272,000 ක ආදායම භාරයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණු අතර, එම ආදායම් ලංකා ධීවර සංස්ථාව විසින් ලබාගන්නා බව භාරයේ සභාපති විසින් දක්වා තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපන ශාලාව සඳහා 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.1,143,868 ක් වූ ශීතකරණ 03 ක් භාවිතයට ගැනීමෙන් තොරව ආපන ශාලාව තුළ තිබුණි.

(ආ) වෙළඳසැල් 128 කින් යුතුව ඉදිකර තිබූ සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් 64 ක්, 2011 හා 2012 වර්ෂ වලදී රු. 9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පත්කර තිබුණද, විගණිත දින වූ 2016 දෙසැම්බර් 31 වනවිට එම තොග වෙළඳසැල් 48 ක් හා සිල්ලර වෙළඳසැල් 12 ක් වෙළඳ කාර්යයන් සඳහා බදු දීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 3.2 ප්‍රකාරව සැපයුම්කරුවකු තෝරා ගැනීම ලංසු කැඳවීම මගින් සිදුකල යුතු වුවත් එපරිදි කටයුතු නොකර පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා ආයතනයක් තෝරාගෙන තිබුණි. එම ආයතනය සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුම අනුව මාසිකව රු.1,250,000 ක් බැගින් වර්ෂයකට රු.15,000,000 ක් ගෙවිය යුතු වුවද ඊට අමතරව මසකට රු.330,000 ක් බැගින් 2016 වර්ෂයේ දී රු.3,960,000 ක් ගෙවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සඳහා අනුමත කර තිබූ 43 කින් යුතු කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සකසා තිබුණ ද එය අනුමත කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කලයුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම භාරය විසින් පිළියෙල කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

**-----------------------------------**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව පිළියෙල කලයුතු වාර්ෂික අයවැය ලේඛනය 2014 වර්ෂයේ සිට පිළියෙල කල ඉදිරිපත් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

**--------------------------**

භාරය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති අතර, අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිලියෙල කලයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම භාරය විසින් පිලියෙල කර නොතිබුණි.

**5.5 විගණන කමිටු**

**--------------------**

විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයීම, අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබීම යනාදී පසුබිමක් තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම තුළින් පමණක් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත නොහැකි වී තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

**----------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) | බැංකු සැසඳුම් නියමිත පරිදි පිළියෙල කර නොතිබීම. |
| | (ii) | මුදල් පොතේ සටහන් චෙක්පත් උප පත්‍රිකා සමඟ නොසැසඳීම. |
| (ආ) වෙළඳ කුටි බදුදීම | (i) | සියලු වෙළඳ කුටි බදු දීමට කටයුතු නොකිරීම. |
| | (ii) | වෙළඳ කුටි අතුරු බදු දීමට ඉඩදීම. |
| (ඇ) ආදායම් ගිණුම්ගත කිරීම | (i) | කඩකුලී ආදායම් සඳහා ඉන්වොයිස් නිකුත් කර නොතිබීම. |
| | (ii) | බැංකු තැන්පත් උපලබ්ධි වීමට පෙර ලදුපත් නිකුත්කර තිබීම. |
| | (iii) | ලැබීම් කුවිතාන්සි නිකුත් නොකර මුදල් පොතට ගණුදෙනු ඇතුලත් කර තිබීම. |
| (ඈ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම. | | භාර මණ්ඩලයේ රැස්වීම්වල සියලු කටයුතු වාර්තා කිරීම සඳහා වාර්තා පොතක් පවත්වා නොතිබුණි. |